2023
ජූලි

# ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

## නිෂ්පාදන සහ සේවා

STATISTICS DEPARTMENT
CENTRAL BANK OF SRI LANKA


**2023 ජූලි මාසයේ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක මගින් සේවා ක්‍රියාකාරකම්වල වර්ධනයක් ද නිෂ්පාදන ක්‍රියාකාරකම්වල පහත වැටීමක් ද පෙන්නුම් කරන ලදී.**

**නිෂ්පාදන ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත්වීමේ යම් ප්‍රමාදයක් පිළිඹිබු කරමින්, නිෂ්පාදන අංශයේ ගැනුම් කළමණාකරුවන්ගේ දර්ශකය 2023 ජූලි මාසයේදී 44.6ක දර්ශක අගයක් වාර්තා කරමින් අඛණ්ඩව පහත වැටුණි.** මේ සඳහා සියලුම උප-දර්ශකයන්ගේ පසුබැස්ම හේතු විය.

**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2023 ජූලි** **44.6**

නිෂ්පාදන සහ නව ඇණවුම් පහත වැටීම සඳහා ප්‍රධාන වශයෙන් ආහාර හා පාන වර්ග නිෂ්පාදන සහ රෙදිපිළි හා ඇඟලුම් නිෂ්පාදන අංශවල දුර්වල ක්‍රියාකාරීත්වය හේතු විය. මෙහිදී, ආහාර හා පාන වර්ග නිෂ්පාදනවල වෙළෙඳපොළ මිල අඩු කිරීම් හමුවේ වුවද, ඉල්ලුමෙහි පහත වැටීමක් දක්නට ලැබුණු බව සමීක්ෂණයට ප්‍රතිචාර දැක්වූවන් සඳහන් කරන ලදී. තවද, ගෝලීය වෙළඳපොළ තුළ පවතින දැඩි තරගකාරීත්වය මෙන්ම අයහපත් ඉල්ලුම් තත්ත්වයන් හේතුවෙන් රෙදිපිළි හා ඇඟලුම් සඳහා වූ ඇණවුම් තවදුරටත් අඩු මට්ටමක පැවතුණි. නව ඇණවුම් සහ නිෂ්පාදන අඩු වීමට සමගාමීව, මෙම මාසයේ දී සේවා නියුක්තිය සහ තොග මිලදී ගැනුම් ද පහත වැටුණි. තවද, බොහෝ සමාගම් ජූලි මාසයේ දී ද අත්‍යවශ්‍ය පුරප්පාඩු සඳහා පමණක් නව බඳවාගැනීම් සිදුකරමින් අඩු සේවක සංඛ්‍යාවක් පවත්වාගෙන යාමට කටයුතු කරන ලදී. මේ අතර, පෙර මාසයට සාපේක්ෂව 2023 ජූලි මාසයේදී, ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය අඩු විය.

නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

| විචලයය | ජූනි. | ජූලි. | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | 47.3 | 44.6 | - | **වැඩි වේගයකින් පහළ යෑමක්** |
| | | **උප-දර්ශක** | | |
| නව ඇණවුම් | 49.5 | 47.5 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| නිෂ්පාදන | 49.5 | 41.9 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| සේවා නියුක්තිය | 42.5 | 41.9 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| තොග මිලදී ගැනුම් | 43.4 | 47.0 | + | අඩු වේගයකින් පහළ යෑමක් |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | 48.5 | 45.5 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

වත්මන් ආර්ථික පරිසරය සැලකිල්ලට ගනිමින් ඉදිරි මාස තුන තුළ නිෂ්පාදන අංශයෙහි ක්‍රියාකාරකම් සඳහා වන අපේක්ෂා සුළු වශයෙන් ඉහළ යන ලදී.

### ගෝලීය ප්‍රවණතා: නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

නිෂ්පාදන අංශයෙහි ගෝලීය ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, 2023 ජූලි මාසයේ දී 48.7ක දර්ශක අගයක් වාර්තා කරමින් ජූනි මාසයේ පැවති අගයෙහිම නොවෙනස්ව පැවතුණි.

චීනය, සිංගප්පූරුව සහ රුසියාව යන රටවල පසුගිය මාසයට සාපේක්ෂව 2023 ජූලි මාසයේ දී ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අඩු වේගයකින් වර්ධනය විය. එසේ වුවද, යුරෝපා කලාපය, එක්සත් රාජධානිය, එක්සත් ජනපදය සහ ඉන්දියාව යන රටවල ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක පසුගිය මාසයට සාපේක්ෂව 2023 ජූලි මාසයේ දී පහළ යන ලදී.

*මූලාශ්‍රය: එස්&පී ග්ලෝබල් (S&P Global)[1] ආයතනය, 2023 අගෝස්තු 14 වන දිනට*

---

*[1] එස්&පී ග්ලෝබල් (S&P Global) ජාත්‍යන්තරව ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරන ප්‍රධාන ආයතනයක් වන අතර, ආර්ථිකයන් 40 කට අධික ප්‍රමාණයක් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරනු ලබයි.*

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, සේවා ක්‍රියාකාරකම්හි අඛණ්ඩ වර්ධනයක් පෙන්නුම් කරමින්, 2023 ජූලි මාසයේ දී දර්ශකාංක 59.5ක් දක්වා තවදුරටත් ඉහළ ගියේය.** මේ සඳහා නව ව්‍යාපාර, ව්‍යාපාර ක්‍රියාකාරකම්, සේවා නියුක්තිය සහ අපේක්ෂිත ව්‍යාපාර ක්‍රියාකාරකම්හි සිදු වූ ඉහළ යෑම් හේතු විය. කෙසේ වුවද, ජූලි මාසය තුළ දී නිමකිරීමට නියමිත කාර්යයන් අඩු අගයක පැවතුනි.

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය**

**59.5**


**2023 ජූලි**

සේවා අංශයේ නව ව්‍යාපාර පිළිබඳව සලකා බැලීමේ දී, ප්‍රධාන වශයෙන්, නවාතැන් ආශ්‍රිත සේවා, මූල්‍ය සේවා, අනෙකුත් පෞද්ගලික සේවා සහ වෘත්තීය සේවා යන උප අංශවල දක්නට ලැබුණු ඉහළ යෑම් සමඟ, 2023 ජූනි මාසයට සාපේක්ෂව 2023 ජූලි මාසයේ දී නව ව්‍යාපාර ඉහළ ගියේය.

බොහෝ උප අංශවල දක්නට ලැබුණු වර්ධනයන් සමඟ 2023 ජූලි මාසයේ දී ව්‍යාපාර ක්‍රියාකාරකම් අඛණ්ඩ ඉහළ යෑමක් පෙන්නුම් කළේය. ඒ අනුව, 2023 වසරේ මේ දක්වා කාලය තුළ ඉහළම සංචාරක පැමිණීම් ජූලි මාසයේ දී වාර්තා වීමත් සමඟ, නවාතැන් ආශ්‍රිත සේවාවල වර්ධනයන් ද සිදු විය. තවද, වෙළඳපොළ පොලී අනුපාත ක්‍රමානුකූලව අඩුවීම හේතුවෙන් මූල්‍ය සේවා උප අංශය තවදුරටත් වර්ධනය විය. මීට අමතරව, අනෙකුත් පෞද්ගලික සේවා සහ වෘත්තීය සේවා යන උප අංශ ද ජූලි මාසය තුළ ධනාත්මක වර්ධනයන් පෙන්නුම් කළේය.

මාස 15ක කාලයකට පසු පළමු වරට සේවා නියුක්තිය ඉහළ ගිය අතර, මේ සඳහා සමාගම් කිහිපයක් විසින් සිදු කරන ලද නව බඳවා ගැනීම් හේතු විය. මේ අතර, ජූලි මාසයේ දී, නිමකිරීමට නියමිත කාර්යයන් අඩු වේගයකින් පහළ ගියේය.

සේවා අංශයෙහි
ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

| විචල්‍යය | ජූනි | ජූලි | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **56.7** | **59.5** | **+** | **වැඩි වේගයකින් ඉහළ යෑමක්** |
| | | **උපදර්ශක** | | |
| නව ව්‍යාපාර | 59.4 | 62.0 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| ව්‍යාපාර ක්‍රියාකාරකම් | 61.9 | 67.5 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 50.0 | 51.0 | + | නොවෙනස්ව පැවතීමක සිට ඉහළ යෑමක් |
| නිමකිරීමට නියමිත කාර්යයන් | 41.4 | 45.1 | + | අඩු වේගයකින් පහළ යෑමක් |
| අපේක්ෂිත ඉදිරි ව්‍යාපාර ක්‍රියාකාරකම් | 70.8 | 71.7 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

පවත්නා හිතකර ආර්ථික තත්ත්වය හේතුවෙන් ඉදිරි මාස තුන සඳහා ව්‍යාපාර ක්‍රියාකාරකම් පිළිබඳ අපේක්ෂාවන් අඛණ්ඩව 2023 ජූලි මාසයේ දී ද ඉහළ ගියේය.

## ගෝලීය ප්‍රවණතා: සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

ගෝලීය සේවා ක්‍රියාකාරකම්හි ඉහළ යෑමක් පෙන්නුම් කරමින්, ගෝලීය සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2023 ජූලි මාසයේ දී 52.7ක් වාර්තා කළේය.

චීනය, ඉන්දියාව, එක්සත් රාජධානිය, ඇමරිකා එක්සත් ජනපදය සහ ජපානය යන රටවල සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අනුව එම රටවල සේවා අංශය පසුගිය මාසයට සාපේක්ෂව 2023 ජූලි මාසයේ දී වර්ධනයක් පෙන්නුම් කළේය.

*මූලාශ්‍රය: එස්&පී ග්ලෝබල් (S&P Global)[1] ආයතනය, 2023 අගෝස්තු 14වන දිනට*

***තාක්ෂණික සටහන:***

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

| | |
|---|---|
| සේවා නියුක්තිය | : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන |
| ගැනුම් තොගය | : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමුද්‍රව්‍ය |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය |
| නිමකිරීමට නියමිත කාර්යයන් | : නිම කිරීමට නොහැකි වූ ඇණවුම් |

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.